**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2019**

**-----------------------------------------------**

**1.1 මතය**

**-------**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 15 (2) වගන්තිය අනුව තමා වෙත නිකුත් කරන ලද ඔප්පුව යටතේ වූ ප්‍රතිලාභ අහිමි වී ඇති විට ඒ බව මණ්ඩලය විසින් එම දායකයාට දැන්විය යුතුය. 2019 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලය විසින් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා බඳවාගෙන තිබුණු මුළු දායක සංඛ්‍යාව 750,021 ක් වූ අතර මෙම දායකයන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අක්‍රීය දායකයන් සංඛ්‍යාව 288,234 ක් ලෙස හඳුනාගෙන තිබුණි කෙසේ වෙතත් පරිගණක මෘදුකාංගය නිසිපරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2015 ජනවාරි 01 දිනෙන් පසු අක්‍රිය වී ඇති දායකයින් හඳුනාගෙන නොතිබූ අතර මේ නිසා එදිනෙන් පසු ප්‍රතිලාභ | යෝජනා ක්‍රමයට බඳවාගන්නා සාමාජිකයන්ගේ තොරතුරු රැස්කරනු ලබන පරිගණක මෘදුකාංගය නිසිපරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අක්‍රිය සාමාජිකයන් සම්බන්ධ නිවැරදි තොරතුරු ලබාගැනීමට නොහැකිවීමෙන් මෙම තත්වය උද්ගත වී ඇති බව දක්වා තිබුණි. | මණ්ඩලයේ ප්‍රධාන කාර්යය මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම වන නිසා මේ පිළිබඳ දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| අහිමි වූ සාමාජිකයින්ට ඒ පිළිබඳව දැනුවත් කළ නොහැකි වී තිබුණි. | | |
| (ආ) 1999 අංක 33 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල (සංශෝධන) පනාත් 6 අ (1) වගන්තිය අනුව සමාජ ආරක්ෂණය, සමාජ සුභසාධනය, රක්ෂණය, ජීව ගණක තක්සේරුව, පරිපාලනය, මුදල් හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති හෝ හැකියාවන් පෙන්නුම් කර ඇති තැනැත්තන් අතරින් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත කාර්මික උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය. 2018 මැයි මාසයෙන් පසු එබඳු කමිටුවක් ක්‍රියාත්මකව නොපැවතුණි | පනතේ සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි තාක්ෂණික කමිටුවක් පත්කිරීමට නියමිතව ඇත. | ආයතනයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අප්‍රමාදව කමිටුව පත් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.5.3 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් 48 දෙනෙකුගෙන් රු.1,335,805 ක් අයකර ගත යුතුව පැවතුණි. ඒ තුළ පැවති වර්ෂ 06 ට වඩා වැඩි ශේෂ වටිනාකම රු. 441,146 ක් වී තිබුණි. | වර්ෂ 06ට වඩා වැඩි රු.441,146 ක ශේෂයෙන් රු.176,004 මුදලක් මේ වන විට නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයකරගෙන ඇති අතර, ඉතිරි අයකර ගැනීම් සඳහා සිහිකැඳවීම් ලිපි අදාළ නිලධාරීන් වෙත යොමු කර ඇති බව දක්වා තිබුණි. | මණ්ඩලය විසින් අයකරගත යුතු ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,647,530 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,126,602 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,520,928 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා වර්ෂයේ වැටුප් සහ දීමනා වියදම ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා "සුරැකුම" සහ "ආරස්සාව" යන සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම 02 යටතේ දිස්ත්‍රික්ක 25 ක සෘජු බඳවාගැනීම් යටතේ "දායකයන් 50,000 ක් බඳවාගැනීමට සැළසුම් කර තිබුණද දායකයන් 37,279 ක් පමණක් බඳවාගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ බඳවාගත් දායකයන් සංඛ්‍යාව වූ 83,346 හා සැසඳීමේදී සියයට 53 ක අඩුවීමකි. සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික්ක 03 ක ල බඳවාගැනීම් 100ට වඩා අඩුවූ අතර දිස්ත්‍රික්ක 08 ක එම සංඛ්‍යාව 500 ට වඩා අඩු වී තිබුණි. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ දැඩි කැපවීම මත ග්‍රාම නිලධාරීන් නොවන අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇතිව 2019 වර්ෂය තුළ සාමාජිකයන් 38,543 දෙනෙකු බඳවාගැනීමට කටයුතු කරන ලදී. මෙම තත්ත්වය මණ්ඩලයට සෘජුව පාලනය කිරීමට නොහැකි තත්වයක් වේ. | දායකයන් බඳවාගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බව. |
| (ආ) | මණ්ඩලය විසින් ඉකුත් වර්ෂවලදී දායකයන් බඳවාගැනීමේ ක්‍රමවේදය සඳහා ග්‍රාම නිලධාරින්ගේ සේවය ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම සේවාව ලබා ගැනීමට නොහැකිවීමේ හේතුවෙන් නිලධාරීන් 72 ක් බඳවා ගෙන අලෙවි ජාලයක් පිහිටුවා තිබූ අතර මේ සඳහා සමස්ථ වියදම රු.3,645,670 ක් වී තිබුණි. මෙම අලෙවිජාල සමාජිකයන් මගින් මැයි මාසයේ සිට දායකයන් බඳවා ගැනීම ආරම්භ කර තිබුණද 2019 ඔක්තෝබර් මාසයේ සිට එම නිලධාරීන්ද අදාල ව්‍යාපෘතියෙන් ඉවත්වීම නිසා 2019 දෙසැම්බර් 31 වන විට සාමාජිකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මකව නොතිබුණි. | රාජ්‍ය නිලධාරි ජාලයේ සේවය නොලැබීමත් සමග, ව්‍යාපාර ප්‍රමාණය මත කොමිස් මුදල් ගෙවීමට යටත් ස්වාධීන අලෙවි ජාලයක් පිහිටුවන ලදී. එම අලෙවි ජාලය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුගේ මෙහෙයවීම සහ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ අතර, අලෙවි ප්‍රධානි සහ පළාත් ප්‍රධානීන්ගෙන් අපේක්ෂිත ප්‍රගතියක් නොලැබීමත් 2019 ඔක්තෝබර් මස සිට කිසිදු දැනුම්දීමකින් තොරව සේවයෙන් ඉවත්වී ඇති බැවින්ද ගිවිසුම් අවලංගු කරන ලදී. | දායකයන් බඳවාගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බව. |
| (ඉ) | මණ්ඩලය විසින් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන කලාකරුවන්ට විශ්‍රාම වැටුප් ලබාදීමේ යෝජනා ක්‍රමය සඳහා සංස්කෘතික අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.94,000,000 ක් මණ්ඩලය වෙත ලබාදී තිබුණි. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2020 ජනවාරි මාසය දක්වා දායකයන් 165 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව කලාකරුවන් සඳහා ක්‍රියාත්මක කරන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවාගෙන ඇති කලාකරුවන්හට වාරික ගෙවීම සඳහා අඛණ්ඩව සිහිකැඳවීම් සිදුකර ඇත. වාරික නොගෙවන සාමාජිකයන්ගේ තොරතුරු සංස්කෘතික කටයුතු | මණ්ඩලය විසින් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකු දායකත්වය ලබා ගෙන තිබුණු නමුත් 2020 අගෝස්තු වන විට එහි සක්‍රීය දායකයන් සංඛ්‍යාව 71 දෙනෙක් පමණක් වී තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති බව දක්වා තිබුණි. | |
| (ඊ) | මණ්ඩලය විසින් දකුණු කොරියාවේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් වෙත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා දකුණු කොරියාවේ ජාතික විශ්‍රාම වැටුප් ආයතනය සමඟ සමාලෝචිත වර්ෂයේ ජුනි 18 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම අවබෝධතා ගිවිසුමේ කාර්යයන් 06 ක් ඇතුළත් වුවද ඉහත දක්වා ඇති පරිදි දකුණු කොරියාවේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමේ මූලික කාර්යය එයට ඇතුළත් කර නොතිබුණි. එසේම 2020 අගෝස්තු මාසය වන විට ගිවිසුම අත්සන් කර වර්ෂයක් අවසන්ව තිබූ නමුත් එහි කාර්යයන් කිසිවක් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොරියාව ඇතුළු අනෙකුත් රටවල විදේශීය රැකියා කරන්නන් සඳහාද විශ්‍රාම වැටුපක් සකස් කිරීම සඳහා අප ආයතනය කටයුතු කරමින් පවතින අතර, මෙම ගිවිසුමෙහි මූලික කාර්යය වනුයේ කාර්යය මණ්ඩලය වෙත පුහුණු අවස්ථා ලබා දීම මිස, කොරියාවේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම නොවේ. | දකුණු කොරියාවේ සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අවබෝධතා ගිවිසුම ඇතිකරගත් බව 2017 සැප්තැම්බර් 18 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2017 /232 මගින් දක්වා තිබුණි මේ අනුව ගිවිසුමෙහි මූලික පරමාර්ථ ඉටුවන අයුරින් කටයුතු කල යුතු බව. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් කළමනාකරණ තොරතුරු පද්ධතියක් මිළදී ගැනීමට 2018 වර්ෂයේදී සැපයුම්කරුවකු තෝරා ගෙන තිබූ අතර 2019 නොවැම්බර් මාසය වන විට අදාල කාර්යය සම්පූර්ණ කිරීමට ගිවිසුම්ගතව තිබුණි. එසේවුවත් අදාළ අදියරයන් 5 න් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණ කර තිබුණේ එක් අදියරයක් පමණි. තවද මේ කාර්යය වෙනුවෙන් වර්ෂ 4 ක කාලයක සිට රඳවාගෙන තිබුණු රු.12,511,000 ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදීද ඌන උපයෝජිතව පැවතුණි. | අවසන් වරට අනුමතවූ 3 වන කාලරාමුවට අනුව 2019 නොවැම්බර් 01 දින වන විට මෘදුකාංග පද්ධතිය සංවර්ධන කටයුතු අවසන් කර අප ආයතනයට ලබාදීමට නියමිතව තිබූ අතර 2019 දෙසැම්බර් 31 දින වන විට මෘදුකාංගය සංවර්ධනය කර අප වෙත ලාදීමට එපික් ලංකා ආයතනය අපොහොසත්වූ බව දක්වා තිබුණි. | මණ්ඩලයේ පරිගණක පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කඩිනම්ව සිදුකර දායකයන් අක්‍රීය තත්ත්වයට පත්වීම අවමකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ලේ 5 වන මහල නව ශ්‍රවණාගාරයක් | ශ්‍රවනාගාරය ඉදි කිරීම සඳහා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය විසින් රු.540,000 ක මුදලක් | තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් මත ක්‍රියා කල යුතු බව. |

| | | |
|---|---|---|
| ඉදිකිරීම සඳහා තාක්ෂණික වාර්තාවක් ලබාගැනීමකින් තොරව 2019 ජුලි මාසයේදී කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. මේ අතර, 2019 නොවැම්බර් මාසයේදී මොරටුව විශ්ව විද්‍යාලය මගින් ලබා දෙන ලද තාක්ෂණික වාර්තාව අනුව 5 වන මහලක් ඉදිකිරීමට ගොඩනැගිල්ල ශක්තිමත් නොවන බව දන්වා තිබුණු අතර ඒ අනුව කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.731,244 ක් මේ වෙනුවෙන් වැයකර තිබූ අතර, සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය විසින් මේ සඳහා ලබාදී තිබුණු රු.540,000 ක් පුහුණු අධ්‍යයන වියදම් යටතේ වැයකර තිබුණි. මෙම සියලු වියදම් නිශ්කාර්ය වියදම් වී තිබුණි. | ලබාදෙන ලදී. 2019.12.31 දින එම වියදම පුනරාවර්තන වියදම් යටතේ භාෂා පුහුණු කිරීම් හා වෙනත් වියදම් යටතේ ගිණුම්ගත කරන ලදී. එම වියදම 2020 වර්ෂයේ මූලධන වියදමක් ලෙස නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දක්වා තිබුණි. | |

## 3.3 වත්කම් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිළිබඳව ප්‍රචාරක කටයුතු වෙනුවෙන් සකස්කරන ලද කෙටි වාර්තා චිත්‍රපටි දෙකක් ඇතුලත් රු.603,675 ක් වූ සංයුක්ත තැටි 4762 ක් වර්ෂ 06 කට වැඩි කාලයක සිට නිකුත් නොකර ගබඩාවේ පැවතුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන කපාහැරීමට කටයුතු නරන බව දන්වා තිබුණි. | ප්‍රචාරණ කටයුතු සිදුකිරිමේදී එහි අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කර ක්‍රියා කලයුතු බව. |

## 3.4 ආර්ථික නොවන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් අවශ්‍ය අරමුදල් වෙන්කර ගැනීමකින් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, රජයේ තක්සේරුව වූ රු.165,000,000 ක් ඉක්මවා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමට විශ්‍රාම වැටුප් අරමුදලින් රු.195,000,000 ක් ගෙවා ගොඩනැගිල්ලක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධව පොදු ව්‍යාපාර කාරක සභාවේ | මේ සම්බන්ධයෙන් 2020 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර, 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම්වලට ගිණුම්ගත කිරීමට පියවර ගනු ලබන බව දක්වා තිබුණි.. | ගොඩනැගිල්ල මිළදී ගැනීම් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත්නම් අදාළ වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන වැඩිපුර ගෙවීම අයකර ගැනීමට කටයුතු කළ යුතු බව සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ උපදෙස් පරිදි |

| | | |
|---|---|---|
| උපදෙස් පරිදි වර්තමාන වටිනාකම තක්සේරුකර ගිණුම් ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය වනවිට ගොඩනැගිල්ල මිළදීගෙන වර්ෂ 05 ක් ගතවී තිබුණද මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර මුදල් ගෙවීමට සම්බන්ධව වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගෙන නොතිබුණි. | | වර්තමාන වටිනාකම තක්සේරුකර ගිණුම් ගත කිරීමට පියවර ගත යුතු බව. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සම්බන්ධීකරණ නිලධාරි තනතුරු 18 ක් ඇතුළු පුරප්පාඩු 25 ක් පැවතීම සමාජ ආරක්ෂණ මණ්ඩලයේ දායකයන් බඳවා ගැනීම ඇතුළු කටයුතු වලට අහිතකර ලෙස බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | දිගු කාලයක් සම්බන්ධීකරණ නිලධාරි තනතුරු පුරප්පාඩුව පවතින හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී | ආයතනයේ මෙහෙයුම් කටයුතුවලට බාධා නොවීමට අවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් අප්‍රමාදව බඳවා ගත යුතු වීම. |